**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2021**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශනය

### 1.1 තත්වාගණනය කල මතය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි .
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන731.3 ක් වටිනා වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වී භාවිතයේ පැවතුන අතර මෙම වත්කම්වල ඵලදායි ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී අදාල ගිණුම්වල ගැලපීම් කටයුතු සිදු කර ඉදිරිපත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 90 ඡේදය ප්‍රකාරවප්‍රත්‍යාගනයට අදාළ තොරතුරු හෙළිදරව් කර නොතිබීම සහ ප්‍රත්‍යාගනය කල වත්කම් සම්බන්ධ උපලේඛන පවත්වා නොතිබීම හේතුවෙන් වර්ෂ 10 ක කාලයක සිට පැවත එන රු.මිලියන9.3 ක් වූ ප්‍රත්‍යාගණන අතිරික්ත ශේෂයෙහි නිරවද්‍යතාවය පිළිබඳ තහවුරු කර ගත නොහැකි විය. | ප්‍රත්‍යාගණන අතිරික්තය ක්‍රමක්ෂය කිරීම තුලින් සමුච්ත අරමුදලට මාරු කිරීම මඟින් මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය . |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාවිතයෙන් ඉවත් කර තිබුණු වත්කම් වලට අදාළ ක්ෂය වීම්, ක්ෂය වියදම අඩුවීමක් ලෙස සලකා සමස්ථ ක්ෂය වියදමෙන් එම වත්කම්වල ක්ෂයවීම් අඩුකර දැක්වීම නිසා වර්ෂයේ ක්ෂය වියදම රු. මිලියන 4.8 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වේ. ගිණුම්ගත කිරීමේ වරද මේ වන විටත් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ක්ෂය වියදම් නියමිත පරිදි ගණනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කර මේ වන විට භාවිතයට ගනු ලබන පිරිවැය රු. මිලියන 128 ක් වූ ඉදිකිරීම් වැඩ 05 ක් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනිත කිරීමකින් තොරව නොනිමි වැඩ ශේෂය තුළ දක්වා තිබුණි. මේ හේතුවෙන් භාවිතයට ගනු ලබන මෙම වත්කම්වල රු. මිලියන 3 ක් වූ ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘති 04 ක් ප්‍රාග්ධනිත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. ඉතිරි ව්‍යාපෘතියේ අවසාන බිල්පත ඉදිරිපත් කර ඇති අතර වැඩ අවසන් කිරීමේ සහතිකය ලබා ගැනීම සඳහා උපදේශණ ආයතනය මගින් සාකච්ඡා ගණනාවකදී ඉල්ලුම් කල නමුත් මේ වන විටත් ඉදිරිපත් කර නොමැත. එබැවින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති නමුත් අවසන් බිල්පත සඳහා ගෙවීම් සිදු කර නොමැත. | වැඩ නිමකිරීමේ සහතික අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2021 වර්ෂයේ දී අධිකාරියට ලද ප්‍රාග්ධන ප්‍රදාන රු. මිලියන 1.7 ක් භාවිතා කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තියට පටහැනිව පුනරාවර්තන ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශන දක්වා තිබීම හේතුවෙන් ආදායම එම අගයෙන් වැඩියෙන්ද ප්‍රාග්ධන ප්‍රදාන එම අගයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වුණි. | එකඟ වේ.2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) වර්ෂ 8 කාලපරිච්ඡේදයක සිට පැවත එන ලැබිය යුතු රඳවා ගැනීමේ බදු රු. මිලියන 3.3 ක් සහ 2019 වර්ෂයට පෙර සිට පැවත එන ගෙවීමට වගකීමක් නොමැති ආදායම් බදු සඳහා වූ වෙන් කිරීම් රු. මිලියන 1.6 ක් ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ දෙකකට වඩා පැරණි රඳවා ගැනිමේ බදු ආදායම් බදු වලට හිලව් කල නොහැකි බැවින් එය පරීක්ෂා කර බලා 2022 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීමේදි මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. . | ලැබිය යුතු රඳවා ගැනීමේ බදු හා ආදායම් බදු සඳහා වූ වෙන් කිරීම් ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) බොල්ණය ප්‍රතිපාදනය සඳහා පැහැදිලි පදනමක් අනුගමනය නොකර ණයගැතියන්ගෙන් සියයට 72 ප්‍රමාණයක් සඳහා රු. මිලියන 23.7 ක් බොල් ණය ලෙස වෙන්කර තිබුණි. | බොල්ණය වෙන් කිරීම සිදු කිරීමේදී එක් එක් ණයගැති කෙරෙහි වෙන් වෙන්ව ණයගැති ශේෂ අයකරගැනීමේ අවිනිශ්චිතභාවය සැලකීම වෙනුවට රාජ්‍ය ආයතන,සංගම්/සම්මේලන හා පෞද්ගලික යන ප්‍රධාන අංශ තුනට අදාලව බොල්ණය වෙන් කිරීම හා කපා හැරීමේ ප්‍රතිපත්තියක් සකස් කර ඒ අනුව වෙන් කිරීම් සිදු කර ඇත. | එක් එක් ණයගැතියාගේ ණය අය කර ගැනීමේ හැකියාව විශ්ලේෂණය කර බොල් හා අඩමාණ ණය වෙන් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවියයුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 01 සිට 13 කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු. මිලියන 22.3 ක් වූ ලැබිය යුතු වෙළඳ ශේෂ 63 ක් අයකර ගැනීම කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයවිය යුතු ආයතන ප්‍රධානීන් සමඟ විටින් විට සාකච්ඡා සහ සිහිකැඳවීම් ලිපි මඟින් දැනුවත් කර ඇති අතර ඉදිරියේදීත් මෙම ආයතන වෙත දැනුවත් කිරීම් සිදු කර ඒ සම්බන්ධයෙන් ප්‍රගතිය දැන්වීමට කටයුතු කෙරේ. | දීර්ඝ කාලයක සිට පැවත එන ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2. ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 හා 2021 වර්ෂවල ක්‍රීඩාංගනය සහ පිහිනුම් තටාක වෙන් කිරිමේදි ලබා ගන්නා ලද එකතුව රු. මිලියන 3.1 ක් වූ ආපසු ගෙවන තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021-12-31 දිනට මේ සඳහා ශේෂ සනාථ කරන ලෙසට ලිපි මඟින් ගණුදෙනුකරුවන් දැනුවත් කර ඇත. | ආපසු ගෙවන තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපාදේශ සංග්‍රහය 2006 1.2.1 (අ) ඡේදය | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත් කාලය 2020 නොවැම්බර් 30 දිනෙන් අවසන් වී තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදුකර නව සැපයුම්කරුවෙකු තෝරා නොගෙන 2022සැප්තැම්බර් 30 තෙක් සේවාවන් ලබා ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන6 .4. ක වියදමක් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇතිවූ ප්‍රායෝගික ගැටළු වූ බැවින් කළමනාකාරිත්ව මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී .ඒ අනුව දැනට පිරිසිදු කරන පිරිසිදු කිරීමේ ආයතනයෙන් 2022.06.30 දක්වා පිරිසිදු කිරීමේ සේවාව ලබාගැනීමට කළමනාකාරිත්ව මණ්ඩලය අනුමැතිය ලබාදී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපාදේශ සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 18.3 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 75 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 93.3 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රාග්ධන ප්‍රදාන රු. මිලියන 119.5ක් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගැනීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය 2006 සිට කාර්තුවකට රු.750,000 බැගින් වූ ස්ථාවර බදු කුලියට වසර 30 ක කාල සීමාවක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දී තිබුණි. ගිවිසුම ඇතිකර ගැනීමේදී වාර්ෂික බදු කුලිය වර්තමාන වෙළඳපොල වටිනාකමට ගැලපෙන පරිදි කාලීනව සංශෝධනය කර ගැනීමට අදාල කොන්දේසි බදු ගිවිසුමේ ඇතුළත් නොකිරීම හේතුවෙන් අධිකාරියට ප්‍රවර්තන මිල මත බදුකුලිය ලබාගැනීමේ වාසිය අහිමි වී තිබුණි. | මෙම ගිවිසුම අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් මත අත්සන් කළ ගිවිසුමක් බැවින්, ගිවිසුම සංශෝධනය කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අදහසත් සහ අනෙකුත් අදහස් නීතිපතිට දන්වා යවා නීතිපතිගේ උපදෙස් අපේක්ෂා කර ඇත. | බදු ගිවිසුම සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආදායම් ඉපැයීමේ අරමුණින් සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ආතර් සිල්වා මාවතට මුහුණලා ඉදිකර ඇති කඩකාමර 03 ක් සඳහා තක්සේරුගත මාසික බදු කුලි ආදායමේ එකතුව රු. 113,000 ක් විය. මෙම කඩකාමර බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියට වාර්ෂිකව රු.1,356,000 ක බදු කුලි ආදායමක් අහිමි වී තිබුණි. | ආයතනයේ අත්‍යවශ්‍යම කාරණා දෙකක් මත කඩකාමර දෙකක භාවිතයට ගෙන ඇති බව දන්වමි . | කඩ කාමර කඩිනමින් බදු දීමට කටයුතු කර ආදායම් ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගෘහස්ත ක්‍රීඩාංගනය එළිමහන් ක්‍රීඩාංගනය සහ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනය පිහිටි ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2022 සැප්තැම්බර් 30 දින තෙක් කටයුතු කර නොතිබුණි. | ඉඩම් මෙම අධිකාරියට පවරාගැනීම සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව නිරීක්ෂණය වේ .වසර කිහිපයකට පෙර මෙම අධිකාරිය , කොළඹ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය සහ නාගරික සංවර්ධන අධිකාරිය වැනි ආයතන අතර ලිපි හුවමාරු වී තිබුණි. | ඉඩම් වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අදාල ලිපිගොනු සොයා ගැනීමෙන් පසු මෙම ක්‍රියාවලිය නතර වී තිබෙන්නේ කුමන අදියරේද යන්න තහවුරු කර ගැනීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධීකරණය වෙමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිම | |
| (ඇ) | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධාන පිහිනුම් තටාකය හා කිමිදුම් තටාකය සඳහා ස්ථාපිත ජලය පවිත්‍ර කිරීමේ පද්ධතියේ හා ළමා පිහිනුම් තටාකයේ ජල කාන්දුව වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් අධිකාරියේ ගෘහස්ත ක්‍රීඩාංගනයේ 2021 වර්ෂයේ ජල ගාස්තුව සියයට 71 ක් එනම් රු. මිලියන 3.8 න් වැඩි වී තිබුණි. | ජල කාන්දුව වැලක්විමට අදාල ව්‍යාපෘතිය සිදුකිරිම සඳහා 2021 හා 2022 වර්ෂවල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. නමුත් කොරෝනා ව්‍යසනය හා රටේ ඇති වූ ආර්ථික පරිහාණිය සහ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කල චක්‍රලේඛ වලට අනුව අලුත් ව්‍යාපෘති නතර කිරිමට උපදෙස් ලබා දී තිබූ බැවින් 2023 වර්ෂයෙදි සිදුකිරිමට තිරණය කරණ ලදි. දැනට ඉහත සඳහන් අඩුපාඩු වැලැක්විමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. | ජල කාන්දුව වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඉ) | අධිකාරිය විසින් පරිපාලන කටයුතු සිදු කරන නුවරඑළිය තුරඟ තරඟ පිටිය 2015 වර්ෂයේදී ඇතිකරගත් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව රු.110,000 ක් වූ මාසික කුලියට තුරඟ තරඟ සමාජයක් වෙත බදු දී තිබුණි. එම දේපළ 2018 වර්ෂයේ සිට වසර 04 ක කාලයක් බදු ගිවිසුමක් නොමැතිව හා කුලි ගෙවීමකින් තොරව එම තුරඟ තරඟ සමාජය විසින් අනවසරෙන් භුක්ති විදීම හේතුවෙන් අධිකාරිය වෙත ලබා ගත හැකි සැලකිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. තුරඟ සමාජය විසින් ලිඛිත පූර්ව අනුමැතිය ලබා නොගෙන තුරඟ තරඟ පිටියේ සිදුකර ඇති ඉදිකිරීම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | රෝයල් තුරඟ තරඟ සමාජය විසින් ගිවිසුම් අත්සන් කිරිම දිගින් දිගටම ප්‍රතික්ෂේප කරමින් කටයුතු කිරිම මෙන්ම රජය සතු දේපල අනවසරයෙන් භුක්ති විඳීමින් සිටීම හේතුවෙන් අධිකාරියට සිදුවී ඇති මූල්‍යමය අලාභයද සලකා රෝයල් තුරඟ තරඟ සමාජයට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති උපදෙස් අපේක්ෂා කර ඇති බව දන්වමි .එසේ නීතිපති උපදෙස් ලැබූ විගස රෝයල් තුරඟ තරඟ සමාජයට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගෙන අධිකාරියට අහිමිවූ ආදායම සම්බන්ධව උපදෙස් ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. | බදු කුලි ආදායම් අයකර ගැනීම සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2** **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය වැඩ ආරම්භකර රු. මිලියන 12.3 ක් වැය කර ඇති සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ වට තාප්පය ඉදිකිරීමේ කටයුතු හා රු. මිලියන 31.7 ක් ගෙවීම් සිදු කළ සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ ප්‍රධාන පිවිසුම හා යකඩ වැට ඉදිකිරීම් කටයුතු පිළිවෙළින් 2019 හා 2020 වර්ෂවල නිම කල යුතු වුවද මෙතෙක් වැඩ නිමකර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කොන්ත්‍රාත් කළමණාකරනය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය දිගින් දිගටම ප්‍රමාද වූ අතර රැස්වීම් ගණනාවකදී ඒ පිළිබඳ කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. | ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3** **මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 10 කින් තනතුරු 04 ක් පුරප්පාඩු වී තිබුණි. තෘතියික මට්ටමේ තනතුරු 03 කට අදාලව පුරප්පාඩු 03 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 03 කට අදාලව පුරප්පාඩු 08 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 කට අදාලව පුරප්පාඩු 09 ක් පැවතුණි. එමෙන්ම ජ්‍යෝෂ්ඨ මට්ටමේ එක් තනතුරක්, තෘතියික මට්ටමේ එක් තනතුරක්, ද්විතියික මට්ටමේ තනතුරු03 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් ඇතුළු මුළු තනතුරු 10 ක් සඳහා බඳවා ගැනීමේ පරිපටියක් අනුමත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 19 ක් පැවතුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ද්විතියක මට්ටමේ සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 කට අදාලව පැවති පුරප්පාඩු 23 ක් සඳහා බඳවා ගැනීම් කටයුතු අත්හිටුවා තිබුණි. | අධිකාරියේ සේවක මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර් න කර කර ගැනීමට හා අතිරක්ත තා විධිමත් කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | අධිකාරියේ කාර්ය සාධනයට ඉවහල් වන පුරප්පාඩු තනතුරු පිරවීමට සහ තනතුරුවල අවශ්‍යතාවය මත බඳවා ගැනීම් පරිපාටිය සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |